# 2.8 ලාභදායී බව (Profitability) සහ තරගකාරීත්වය (Competitiveness) ශ්‍රී ලාංකික නිෂ්පාදන සමාගම්වල කාර්යසාධනයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ඩී.ආර්. කරුණානායක
නො.ඒ-35,මද්දුමගේවත්ත ජාතික නිවාස සංකීර්ණය, ගංගොඩවිල, නුගේගොඩ.

## ABSRACT

**හැඳින්වීම**

1977 ආර්ථික ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ වල මූලික අරමුණ වූයේ ජාත්‍යන්තර ආර්ථිකය හා ඒකාබද්ධ වූ නිදහස් වූ විවෘත ආර්ථිකයක් බිහිකිරීමයි. එහිදී අපේක්ෂා කළ එක් අරමුණක් වූයේ මෙරට නිෂ්පාදන ව්‍යවසාය වර්ධනය කර දේශීය හා විදේශීය වෙළඳපලට අවශ්‍ය භාණ්ඩ සැපයුම් කිරීමයි. එහිදී තීරණාත්මක සාධකයන් වූයේ නිෂ්පාදන සමාගම්වල ලාභදායීබව සහ තරගකාරීත්වයයි.

මෑත කාලයේ ජගත් ආර්ථිකය තුළ මෙරට නිෂ්පාදන සමාගම් ලාභදායීත්වය හා තරගකාරීත්වය හමුවේ කවර කාර්යසාධන මට්ටමකට පත්වූයේ ද යන්න විමසා බැලීම වැදගත්ය. මෙබඳු ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අනෙකුත් ආසියාතික රටවල නිෂ්පාදන සමාගම් වල කාර්යසාධන මට්ටම ඉහළ ගිය අතර, මෙරට නිෂ්පාදන සමාගම් වල ක්‍රියාකාරීත්වය සැළකිය යුතු තරමේ මට්ටමකට පත් නොවීය.

**අරමුණ**

පසුගිය දශක දෙක තුළ දී ශ්‍රී ලංකාව සිය ආර්ථික සංවර්ධනය උදෙසා මූලික උපාය මාර්ගයක් වශයෙන් විවෘත ආර්ථික පරිසරයක් තුළ අපනයනය පෙරදැරි කරගත් කාර්මීකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබීය. මෙබඳු ප්‍රතිපත්තියක් තුළින් මෙරට නිෂ්පාදන සමාගම්වල කාර්යසාධනයට ලාභදායී බව සහ තරගකාරීත්වය බලපා ඇති ආකාරය පිළිබඳ විග්‍රහ කිරීම අධ්‍යයනයේ අරමුණ වේ.

**ගැටළුව**

1977 බාහිරාවලෝකන ආර්ථික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වා දීමෙන් පසුව මේ දක්වා කාලය තුළදී නිෂ්පාදන සමාගම් වල කාර්යසාධනයේදී ලාභදායී බව සහ තරගකාරීත්වය කොතෙක් දුරට වැදගත් වී තිබේද යන ගැටළුව ඉස්මතු වේ. එය අනෙකුත් ආසියාතික රටවල සමපාර්ශවයන් හා සසඳන කළ මැනවින් අවබෝධ කරගත හැකිය. එයට හේතුව නම් නිදහස් වෙළඳපොළ ආර්ථිකය ක්‍රමය යටතේ ආසියානු රටවල් කීපයක්ම පසුගිය කාලයේ විශ්මය ජනක ආකාරයේ ආර්ථික වර්ධනයක් ළඟා කරගෙන නව කාර්මික රටවල් බවට පත්වූ නිසාය. එහි ප්‍රත්‍යක්ෂභාවය තීරණය කළ හැක්කේ සාර්ව ක්ෂුද්‍ර මට්ටමේ නිෂ්පාදන කාර්යසාධනය ආර්ථිකයේ විවිධ අංශවලට දායක වූ ආකාරය විශ්ලේෂණාත්මකව නියැදි සමාගම් පැතිකඩ මගින් විමර්ශනය කිරීමෙන් ඒ මගින් විද්‍යාමානවන ගැටළුවේ ස්වභාවය හොඳින් සන්නිරීක්ෂණය කළ හැකිවන නිසාය.

**ක්‍රමවේදය**

මේ අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත ලබාගැනීම, මෙරට තෝරාගත් නිෂ්පාදන සමාගම්වල මූල්‍ය වාර්තා ආශ්‍රිත කරගෙන සිදුවන අතර, ද්විතීයික දත්ත ලබාගැනීම කොළඹ කොටස් හුවමාරුව විසින් ප්‍රකාශයට පත්කර කරන ලද ලයිස්තුගත සමාගම් අත්පොතේ දැක්වෙන සාරාංශ ගත කරන ලද මූල්‍ය ප්‍රකාශන මගින් සිදුවේ.

**සීමාවන්**

මෙම අධ්‍යයනයේදී මතුවන සීමාවන් වන්නේ තරගකාරීත්වය තක්සේරු කිරීමේදී මතුවන ගැටළු, ගිණුම්කරණ සංකල්ප හා ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම නිසා ගිණුම්කරණ සම්ප්‍රදාය තුළ පවත්නා ගැටළු, විගණනය සඳහා භාවිතයට ගන්නා ගිණුම්කරණ දත්ත විෂය බද්ධ ඒවාවීම සහ නිෂ්පාදන සමාගම්වල ලාභදායීබව ගණනය කිරීමේදී මූල්‍ය කළමනාකරණ ගැටළු ආදිය වේ.

නිගමනය

වෙළඳපොළ ආර්ථික ක්‍රියාකාරීත්වය යටතේ මෙරට නිෂ්පාදන සමාගම් සාර්ථක ලෙස නිශ්පාදන ක්‍රියාවලියේ නිරත නොවී ඇති බැවින්, ලාභදායිබව හා තරගකාරීත්වය හමුවේ ඵලදායී කාර්යසාධන මට්ටමක් දක්වා ගමන් නොකළ බවත් පෙනීයයි.
මේ හේතුවෙන් රටේ ආර්ථික ඵලදායිතාව හීනවීමත්, නවෝත්පාදන බිහි නොවීමත්, නිෂ්පාදනයට නැඹුරුවූ ආර්ථික රටාවන් නිර්මාණය නොවීමත්, නිෂ්පාදන සමාගම් වෙළඳපොළින් බැහැරවීමත් ආදී ප්‍රතිඵල ඇතිවිය.

දේශීය හා විදේශීය වෙළඳපොළට උචිත වන පරිදි නිමැවුම් ක්‍රියාවලිය සිදුකිරීමත්, ඒ සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකර ව්‍යවසායකත්වය වර්ධනය කිරීමෙන් ලාභදායීත්වයට හා තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දිය හැකිය.

### පරිශීලන වාර්තා හා ආශ්‍රිත ග්‍රන්ථ


- **Athukorala, P. and S. Rajapathirana, *Liberalisation and Industrial Transformation Sri Lanka in International Perspective*, London: Oxford University Press, 2000.**
- Abeyrathne S. *Anit - Export Bias in the Export Oriented Economy of Sri Lanka Amsterdam 1993.*
- Colombo Stock Exchange, *Handbook of Listed Companies 1997 and 2006, Colombo: CSE.*
- Colombo Stock Exchange Publications *Annual Reports*
- Cuthbertson A. G. and Athukorala P. *Liberalizing Foreign Trade, The Experience of Indonesia, Pakistan and Sri Lanka 1991.*
- Doyle, P.J. Saunders and V. Wong, *" Competition in Global Markets"*, Journal of International Business Studies, 1992.
- *Economic Progress of Independent Sri Lanka 1998* - Central Bank of Sri Lanka
- Frank Wood's and Alan Sangster 2 (2001), *Business Accountancy,* First Indian Reprint.
- John Wild, Leopld A Berustein, K.R. Subramanyam (2001), *Financial Statement Analysis 7th Edition* U.K.
- Karunatilake H.N.S. (1987) *The Economy of Sri Lanka Colombo Centre for Demographic and Social Economic Studies.*
- Michael R. Baye (1997)
  *Managerial Economics and Business Strategy.* U.S.A.
- Nanayakkara G. " *The Study of Best Management Practices in Sri Lanka's High Performing Companies", Journal of Comparative International Management, Vol. 2, No. 1*, 1999.
- Porter, M *Competitive Advantage: Techniques for Analysing Industries and Competitors*, New Youk: Free Press, 1980.
- Philip Kotler (1999) *Marketing Management*, The Millennium Edition Reprinted by India.
- Paul A Samuelson and William D. Nordhous *Economics (1992).* Reprinted U.S.A.
- Paul R. Ferguson, R. Rothschild, (1993) *Business Economics.*
- Robert A. Burgelman, Modest A. Maidique Steven C. Wheel Wright (1996) *Strategic Management of Technology and Innovation, Second Edition*, Printed in U.S.A.
- Toyo Keizai Inc. Japan, *Asian Company Handbook Spring 1997 and Japan Company Handbook 1997.*
- Willam J. Baumol (1997) *Economic Theory and Operations Analysis*, Fourth Edition India.
- World Bank, *World Development Report 1999/2000 and World Development Indicators 1999.*